සති පාසල

7 ශ්‍රේණිය | ගණිතය | අගෝස්තු 2වන සතිය

21 - අනුපාත

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- පෙළ පොතෙහි පිටු අංක 96 හා 97 හි ඇති අනුපාතයක එක් පදයක ප්‍රමාණය දී ඇති විට මුළු ප්‍රමාණය සෙවීම නම් පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- පෙළ පොතෙහි පිටු අංක 97 හා 98 හි ඇති අනුපාතයක එක් පදයක ප්‍රමාණය දී ඇති විට අනෙක් පදවලට අදාළ ප්‍රමාණයන් සෙවීම නම් පාඩම හොඳින් අධ්‍යයනය කරන්න.
- පිටු අංක 95 හා 96 හි ඇති 21.2, 97 පිටුවෙහි ඇති 21.3 සහ 99 පිටුවෙහි ඇති 21.4 යන අභ්‍යාසවල නිරත වන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී ගර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය ගණිතය දෙවන පෙළ පොත (පිටු අංක 96 සිට 99)
- E - නැණ පියස වෙබ් අඩවිය
- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=62#section-22
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=987&section=23
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=qIKaK3nVxhc
- DP Education
  https://www.youtube.com/watch?v=ZmrveAz_cuA&list=PLcUOoycaDS-k0dtIfHHriJpJmc3V0Ouz4&index=23&t=1s

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- අනුපාතයක එක් පදයක ප්‍රමාණය දී ඇති විට මුළු ප්‍රමාණය සෙවීම.
- අනුපාතයක එක් පදයක ප්‍රමාණය දී ඇති විට අනෙක් පදවලට අදාළ ප්‍රමාණයන් සෙවීම.

04. ඇගයීම

(1) උද්භිත උද්‍යානයක එක් ඉඩම් කොටසක ශාක වර්ග 3 ක් සිටුවා ඇත. ඒවා අඹ, දෙළුම් හා දිවුල් වෙයි. සෑම අඹ ගසකට වරක් දෙළුම් ගස් 2 ක් ඉන්පසු දිවුල් ගස් 5 ක් වෙයි.

i) ගස් අතර අනුපාතය ලියන්න.

ii) අඹ ගස් 6 ක් සිටුවා ඇත්නම් සිටුවා ඇති දෙළුම් ගස් ගණන සොයන්න.

iii) දිවුල් ගස් 40 ක් ඇත්නම් එහි ඇති අඹ ගස් ගණන සොයන්න.

(2) ත්‍රිපෝෂ පැකට් එකක මුංඇට, සෝයා හා සහල් 1 : 2 : 3 අනුපාතයෙන් මිශ්‍ර කර ඇත. 360g ක් වන පැකැට්ටුවක අඩංගු වන සහල් ප්‍රමාණය සොයන්න.